# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවන සභාවාරය සඳහා**

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

**ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අනු කාරක සභාව**

# මහජන අදහස් හා යෝජනා කැඳවයි

2026 මැයි මස 06 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම සඳහා පත් කරන ලද අනු කාරක සභාව ගරු රුවන් මාපලගම, පා.ම. සභාපතිත්වයෙන් සහ ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ,පා.ම. සහ ගරු ලුතිනන් කොමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග,පා.ම. යන මහත්වරුන්ගේ සාමාජිකත්වයෙන් සමන්විත වේ. මේ සඳහා උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ගෙන් අදහස් ලබා ගැනීමට අනු කාරක සභාව අපේක්ෂා කරන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් සිය අවධානය යොමු කරනු ඇත.:-

1. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
2. සිසුන් ඉහළ අනුපාතයකින් පාඨමාලාවන්ට ඇතුළත් කර ගැනීම
3. පාඨමාලා තුළ සිසුන් රඳවා ගැනීමේ ගැටලු හා ශිෂ්‍ය සුභසාධන ක්‍රියාවලියේ පවතින අඩුපාඩු හා පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු රැකියා අවස්ථා ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම
4. රැකියා වෙළඳපොළේ සැබෑ ශ්‍රම අවශ්‍යතාව හඳුනා ගැනීම
5. දුෂ්කර ප්‍රදේශවල පිහිටි අධ්‍යාපන ආයතන මුහුණ දෙන අභියෝග සැලකිල්ලට ගැනීම

ඉහත කරුණු සම්බන්ධයෙන් අදහස්/යෝජනා ඉදිරිපත් කිරීමට කවර හෝ සංවිධානයක් හෝ පුද්ගලයකු කැමැත්තේ නම්, යථා පරිදි අත්සන් කරන ලද ලිඛිත සංදේශ <u>2026 ජූලි මස 15 වැනි දින හෝ ඊට පෙර</u> "ලේකම්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් එසේ කළ හැකිය. එසේ නැතහොත්, ෆැක්ස් අංක 011-2777559/011-2777601 වෙත ෆැක්ස් මඟින් හෝ <u>cope@parliament.lk</u> යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද එවිය හැක.

එකී ලිඛිත සංදේශවලට අමතරව වාචික සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට ද කාරක සභාව විසින් නියම කළ හැකිය. මෙම දැන්වීම පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ද (<u>www.parliament.lk</u>) පළකොට ඇත.

**කාරක සභාවේ ලේකම්,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

**2026 ජූනි මස 23 වැනිදා**
**විමසීම් - 011 2777301**

2026.06.23 (දිනමිණ)